කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

# වී අලෙවි මණ්ඩලය

# තනතුරු පුරප්පාඩු

වී අලෙවි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී තනතුර සහ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ලද අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සාමාන්‍යාධිකාරී - (HM 2-1) - තනතුරු 01

**(අ.) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂයක් යටතේ ලබාගත් උපාධියක්

**සමග**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කවර විෂයයක් යටතේ හෝ ලබා ගත් ශාස්ත්‍රපති/ විද්‍යාපති/මට්ටමට නොඅඩු පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර දහ අටක (18) ක පළපුරුද්ද, (මෙම වසර 18 න් අවම වශයෙන් වසර 05 ක් පශ්චාත් උපාධිය ලබා ගැනීමෙන් පසුව විය යුතුය.)

**වෙනත් සුදුසුකම්**

- ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක ප්‍රවීණතාවය
- පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම

**සුදුසුකම්**

බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**පළපුරුද්ද**

වී අලෙවි මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තනතුරෙහි වසර පහ (05) ක පළපුරුද්ද ඇති නිලධාරියකු වීම.

**අනිවාර්ය සුදුසුකම**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයා ගෙන තිබිය යුතු වන අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**(ඇ) වැටුප් ක්‍රමය**

HM 2-1 - 2025 -රු.(161,140 - 12 X 4,850 - 219,340)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව 2026 වර්ෂයට අදාළ වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.)

**(ඈ) වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩි විය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**(ඉ) වෙනත් සුදුසුකම්**

- ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක ප්‍රවීණතාවය
- පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) - (HM 1-1) - තනතුරු 01

**(අ) බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**සුදුසුකම්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය/රාජ්‍ය පරිපාලනය හා මුදල්/ ව්‍යාපාර පරිපාලනය/ කළමනාකරණය හෝ නීතිය පිළිබඳ ප්‍රථම උපාධිය

**හෝ**

වරලත් ගණකාධිකාරී ආයතනයේ අන්තර් මධ්‍ය/පිරිවැය හා කළමනාකරණය/ගණකාධිකාරී III පියවර සම්පූර්ණ කර තිබීම.

**සහ**

ගණකාධිකරණය, මූල්‍ය කළමනාකරණය යන ක්ෂේත්‍ර වලට අදාළව පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**පළපුරුද්ද**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විධායක මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) ක පළපුරුද්දක් (මෙම වසර 15 න් අවම වශයෙන් වසර 03ක් පශ්චාත් උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.)

**(ආ) අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම**

**(i) සුදුසුකම්**

කළමනාකරණ සේවා ගණයෙහි (MM 1-1 ) I වන ශ්‍රේණියේ අවුරුදු පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**(ii) අනිවාර්ය සුදුසුකම**

සුදුසුකම් ලැබීම සඳහා වන සේවා කාලය තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන තිබිය යුතු අතර, එම කාලය තුළ විනයානුකූල දඬුවම් ලබා නොතිබිය යුතුය.

**(ඇ) වැටුප් ක්‍රමය**

HM 1-1 - 2025 -රු.(140,640 - 15 X 4,100 - 202,140)

(2025.03.25 දිනැති 1/2025 අංක දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව 2026 වර්ෂයට අදාළ වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.)

**(ඈ) වයස් සීමාව**

අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 50 ට නොවැඩිවිය යුතුයි. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපායි.

**(ඉ) වෙනත් සුදුසුකම්**

- ඉංග්‍රීසි භාෂාව සම්බන්ධ මනා පරිචය සහ පරිගණක ප්‍රවීණතාවය
- පරිපාලනය, කළමනාකරණය, ගණකාධිකරණය, අලෙවි ප්‍රවර්ධනය හා ප්‍රචාරණය යන විෂයන් සම්බන්ධයෙන් වන දැනුම කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

**පොදු කරුණු**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුයි.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයකම සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
- මෙම තනතුරු ස්ථිර තනතුරු වේ. සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිතය.
- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට තනතුරට ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.
- දැනට රාජ්‍ය ආයතනවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් ආයතනයේ ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- ජීව දත්ත තොරතුරු ඇතුළත් තමා විසින් සකස් කරන ලද අයදුම්පතක් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කරන ලද ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව ඥාතීන් නොවන දෙදෙනෙකුගේ තොරතුරුද ඇතුළත්ව 2026.07.15 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.
- අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.
- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා / හෝ ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.
- පත්වීම් සම්බන්ධයෙන් බලපෑම් කිරීම / සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම නුසුදුස්සෙකු වීමට හේතුවේ.
- පත්වීම් සම්බන්ධයෙන් අවසාන තීරණය වී අලෙවි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

**සභාපති, වී අලෙවි මණ්ඩලය,**
**නිවාස මහ ලේකම් ගොඩනැගිල්ල, 6 වන මහල,**
**සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.**